# 19

# බුදු සමයෙන් පෝෂණය වූ සිංහල සාහිත්‍යය

අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි යන සාහිත්‍ය යුග පිළිබඳ ව පසුගිය වසරේ දී ඉගෙන ගැනීමට ලැබිණි. එම යුගවල සේ ම ඉන් පසු කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර යන යුගවල දී ද දේශීය සාහිත්‍යය දියුණු වූ ආකාරය අපට දැකගත හැකි වේ. එදා සාහිත්‍යකරණයෙහි බොහෝ සෙයින් යෙදී සිටියෝ භික්ෂූන් වහන්සේලා ය; එසේ නොමැතිනම් භික්ෂූන් වහන්සේලා ඇසුරු කළ උගත් ගිහි පිරිසයි. පාසල් අධ්‍යාපනයක් නොව පන්සල් අධ්‍යාපනයක් එදා පැවතීම ඊට හේතුව විය. ධර්මය ඇසුරු කරමින් අධ්‍යාපනය ලැබූ මේ සාහිත්‍යධරයන් අතින් බිහිවූ පොත පත සියල්ල බුද්ධ ධර්මයට සමගාමී විය. ඔවුන්ගේ වස්තුවිෂය වූයේ බෞද්ධාගම හෝ ඊට සම්බන්ධ මාතෘකාවන් ය. අපේ සිංහල සාහිත්‍යය හා බෞද්ධ සාහිත්‍යය දෙකක් නොව එකක් බවට පත් වන්නේ මේ නිසයි.

ඉහත කී යුගවල බිහි වූ ගද්‍ය පද්‍ය කෘති ප්‍රමාණය විශාල ය. ඒ ඒ යුගවල දී රචනා වූ බෞද්ධ සාහිත්‍ය කෘති අතරින් කිහිපයක් හඳුනා ගැනීම මෙම පාඩම මගින් සිදු කෙරේ.

## දඹදෙණිය සාහිත්‍ය යුගය

දඹදෙණිය හා යාපහුව යන රාජධානි කාලවල ලංකාවේ නොයෙක් කැරැලි කෝලාහල පැවැතිණි. එහෙත් මෙම කාලයේ යම් තරමක සාහිත්‍ය උද්දීපනයක් තිබූ බව පෙනේ. සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයක් වූ **සිදත් සඟරාව, පියුම්මල්** නැමැති නිඝණ්ඩුව, ඡන්දස් අලංකාර පිළිබඳ විස්තර කරන **එළු සඳැස් ලකුණ** ආදී ග්‍රන්ථ රාශියක් අපට මෙම යුගයේ දී දැකගත හැකි වේ.

## කුරුණෑගල සාහිත්‍ය යුගය

හස්ති ශෛලපුර හෙවත් කුරුණෑගල කාලයේ බිහි වූ සාහිත්‍ය කෘති ප්‍රමාණය ද අතිමහත් ය. මෙම යුගයේ ලියැවුණු ගද්‍ය ග්‍රන්ථ කිහිපයකි.

### පන්සිය පනස් ජාතක පොත් වහන්සේ

පාලි ජාතකට්ඨකථාව සිංහලයට නැඟීමෙන් රචිත කෘතියකි. මෙය මහජනතාව අතර කෙතරම් ගෞරවාදරයට පාත්‍ර වූවා ද යන්න පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලෙස හැඳින්වීමෙන් ම පැහැදිලි වේ. අප බුදුරජාණන් වහන්සේ පාරමීදම් පුරන සමයේ හෙවත් බොධිසත්ව අවධියේ දී උපන් ආත්මභාව පිළිබඳ මෙහි විස්තර වේ. ධර්ම දේශනා ශෛලිය උපයෝගී කරගනිමින් රචිත මෙහි සඳහන් කතාවස්තු ප්‍රමාණය 547 කි. ආසන්න වශයෙන් ගෙන කතුවරයා මෙම ග්‍රන්ථය පන්සිය පනස් ජාතක පොත යනුවෙන් නම් කර ඇති බව පෙනේ. එදා මෙන් ම අදත් විහාරස්ථානවල මෙම ග්‍රන්ථය එක් අයකු කියවද්දී අනෙක් අය සාධුකාර දෙමින් අසා සිටීම සිරිතක් ව පවතියි.

### සිංහල බෝධිවංසය

පාලි බෝධිවංසයෙහි සිංහල පරිවර්තනයක් ලෙස මෙය හඳුනාගෙන ඇත. බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමේ දී සෙවණ දුන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ඉතිහාසය මෙයින් විස්තර කෙරේ. මේ හැර ආනන්ද බෝධිය, ජය ශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩමවීම, අෂ්ටඵල රුහ බෝධි හා දෙතිස්ඵල රුහ බෝධි රෝපණය ආදී බොහෝ විස්තර මෙහි දක්නට ලැබේ.

### ථූපවංසය

විද්‍යා චක්‍රවර්තී පරාක්‍රම පණ්ඩිත නම් තැනැත්තකු විසින් මෙම ග්‍රන්ථය රචනා කොට ඇත. රුවන්වැලි මහා සෑ රදුන්ගේ විස්තරය මෙහි දක්වේ. ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු ද මෙහි ඇතුළත් වී ඇත. ධාතු වර්ණනා හා එදා සමාජීය තොරතුරු මෙන් ම රුවන්වැලි සෑය නිර්මාණය සඳහා අමුද්‍රව්‍ය සැපයූ අයුරු, එය ගොඩනැගූ අයුරු ආදී බොහෝ තොරතුරු මෙහි දැකගත හැකි වේ.

## ගම්පොළ සාහිත්‍ය යුගය

අනෙක් සාහිත්‍ය යුගවල දී මෙන් ම මෙම යුගයේ ද බොහෝ සාහිත්‍ය කෘති රචනා වී ඇත. මේ යුගයේ දී සිංහල සන්දේශ කාව්‍ය රචනා වීම විශේෂත්වයකි. වෙනත් භාෂාවලින් රචිත සංදේශ කාව්‍ය මීට පෙර හමුවී තිබුණ ද සිංහල සන්දේශ කෘති මුල්වරට හමුවන්නේ මෙම යුගයේ දී ය. ගම්පොළ පස්වන බුවනෙකබාහු රජුගේ කාලයේ දී රචනා වූ මයූර සන්දේශය වැදගත් කෘතියකි. ගම්පොළ සිට දෙවිනුවර උපුල්වන් දෙවියන් වෙත මොණරෙකු අත යැවෙන පණිවිඩයක් මෙහි අඩංගු වේ. මෙහි කතුවරයා පිළිබඳ සඳහනක් නොමැත. මෙම යුගයේ දී රචිත තවත් සන්දේශයකි, තිසර සන්දේශය. මෙම සංදේශ දෙකෙහි බොහෝ සමානකම් අපට දැකගත හැකි වේ.

නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය මෙම යුගයේ රචිත අගනා කෘතියකි. මෙය ගද්‍ය ග්‍රන්ථයකි. ද්විතීය ධර්මකීර්ති නාහිමිපාණන් වහන්සේ මෙම ග්‍රන්ථය රචනා කොට ඇත. එළු අත්තනගලුවංසය, සද්ධර්මාලංකාරය ආදී තවත් වටිනා කෘති රාශියක් මෙම යුගයේ දැකිය හැකි ය.

## කෝට්ටේ සාහිත්‍ය යුගය

සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණ ම ය යුගය ලෙස කෝට්ටේ යුගය හඳුන්වාදිය හැකි ය. මෙම යුගයේ සිටි උගතුන් තරගයට මෙන් ග්‍රන්ථකරණයෙහි නියැලී ඇත. එනිසා සාහිත්‍ය කෘති රැසක් ම බිහි වී තිබේ.

| | |
|---|---|
| සව්සත කෙළ | පැමිණි |
| ගුරුවන් දෙරණ | සපැමිණි |
| පිරිසිදු සිල් | ගිහිණි |
| සියල්ලෝ වියතුන්ට | සිළුමිණි |

යනුවෙන් ලොකයේ උගතුන්ට තමා සිළුමිණක් යැයි ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ප්‍රකාශ කළේ තමන් පිළිබඳ ව වූ කීර්තිය ද, අභිමානය ද නිසා ම බව පැහැදිලි ය. උන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ දෙස බැලීමෙන් ම එය තහවුරු වේ. සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය, කාව්‍යශේඛරය, පඤ්චිකා ප්‍රදීපය, බුද්ධිප්පසාදිනිය යනාදී වටිනා ග්‍රන්ථ රචනා කර ඇත්තේ උන් වහන්සේ ය.

වීදාගම මෛත්‍රේය නාහිමිපාණන් වහන්සේ ද මෙම යුගයේ සිටි වියත් යතිවරයන් වහන්සේ නමකි. උන් වහන්සේගේ ලෝවැඩ සඟරාව අදත් ජනප්‍රිය ග්‍රන්ථයකි. මුල් ම කවිබණ පොත ලෙස මෙය හඳුන්වාදිය හැකි ය. පාලි භාෂාව නොදත් අයට සරල බස්වහරක් යොදාගනිමින් කවියෙන් රචිත මෙම ග්‍රන්ථයෙන් බොහෝ ධර්ම කාරණා ඉගැන්වේ. උන් වහන්සේ විසින් ම රචිත බුදුගුණ අලංකාරය ද සැදැහැගුණ වඩන අගනා පද්‍ය ග්‍රන්ථයකි.

| | |
|---|---|
| කය නම් | අසාර ය |
| බව නම් | භයංකාර ය |
| කියනුව දිවා | රැය |
| කෙරෙම් බුදුගුණ | අලංකාරය |

යනුවෙන් මෙය දිවා රාත්‍රී කීම සඳහා වටිනා පොතක් බව උන් වහන්සේ ම දක්වා ඇත.

මේ හැරුණු විට මෙම යුගයේ තවත් බොහෝ ගද්‍ය හා පද්‍ය රචනා දක්නට ලැබේ. කෝකිල සන්දේශය, ගිරා සන්දේශය, හංස සන්දේශය, දහම්ගැටමාලාව, චූලබෝධිවංසය, පැරකුම්බා සිරිත හා ගුත්තිල කාව්‍යය යනු ඉන් කිහිපයකි.

## මහනුවර සාහිත්‍ය යුගය හා වර්තමානය

මහනුවර යුගය වන විට ලංකාවේ භික්ෂු අධ්‍යාපනය ක්‍රමයෙන් පිරිහීමට පත්වන්නට විය. පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයන් විසින් මිෂනාරී පාසල් අධ්‍යාපනය ආරම්භ කරන ලදි. මෙහි දී අපේ සිංහල බෞද්ධයන්ට අකැමැත්තෙන් හෝ ක්‍රිස්තියානි හා කතෝලික ආගම වැලඳ ගැනීමට සිදුවිය. එහි දී ලැබූ අධ්‍යාපනය ද බෞද්ධ අධ්‍යාපනයක් නොවී ය. එතෙක් සිංහල සාහිත්‍යය හා බෞද්ධ සාහිත්‍යය එකක් ලෙස පැවැතියත් එය වෙනස් වන්නට විය. බෞද්ධ තේමා පදනම් කරගෙන රචනා වූ ග්‍රන්ථ වෙනුවට නොයෙක් තේමා ඔස්සේ ග්‍රන්ථ රචනා වන්නට විය. එසේ ම අනුක්‍රමයෙන් දේශීය උරුමයක් වූ ද ධර්මධර යතිවරයන් බිහි කිරීමේ පුරෝගාමිත්වය ගත්තා වූ පන්සල, පිරිවෙන මුල් කරගත් බෞද්ධ අධ්‍යාපනය ක්‍රමයෙන් පිරිහීමට පත් විය. එය යළි ගොඩනැගුණේ අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ගේ ප්‍රමුඛත්වයෙන් ඇරඹි කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන හා අතිපූජ්‍ය රත්මලානේ ධර්මාලෝක මාහිමියන් ප්‍රමුඛ ව ඇරඹි කැලණියේ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ද ඇසුරිනි.

ලෝකය කොතරම් තාක්ෂණය අතින් දියුණු වුවත් මිනිසුන්ගේ සිතුම් පැතුම් හා ආකල්ප දියුණු වන බවක් දැකිය නොහැකි ය. සාහිත්‍ය රසාස්වාදය තුළින් අපේ සිත්වල ඇති නොදියුණු ආකල්ප දියුණු ආකල්ප බවට වර්ධනය කරගත හැකි ය. පැරණි ග්‍රන්ථ කියවීමෙන් අපේ මෙලොව ජීවිතයට පමණක් නොව පරලොව ජීවිතයට ද වැඩදායි දේ එක්කරගත හැකි ය. පාසල් දරුවන් වන අප අපේ පැරණි සාහිත්‍ය ග්‍රන්ථ පිළිබඳ ව ද දැන සිටීම මෙන් ම ඒවා පරිශීලනය ද ඉතා අගනේ ය.

## සාරාංශය

ලංකා ඉතිහාසයේ රජවරුන් තම තමන්ගේ රාජධානි ලෙස විවිධ ප්‍රදේශ තෝරාගෙන ඇත. ඒවා අනුරාධපුර, පොළොන්නරුව ආදී ලෙසින් හඳුන්වමු. එම යුගවල පහළ වූ ගද්‍ය කෘති මෙන් ම පද්‍ය කෘති ද ගද්‍ය පද්‍ය මිශ්‍ර වූ චම්පු කාව්‍ය ද දැකගත හැකිවේ. පොත්පත් කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ යන කියමන ප්‍රත්‍යක්ෂයක් බවට පත්කර ගත හැකි වන්නේ හොඳ සාහිත්‍ය කෘති පරිශීලනයට යොමු වීමෙනි.

## ක්‍රියාකාරකම

1. ඔබ කැමැති යුගයක රචිත කෘතියක් තෝරාගෙන ඒ පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
2. පහත වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංකය | සාහිත්‍ය යුගය | ග්‍රන්ථ නාමය | කතුවරයා | ගද්‍ය / පද්‍ය | වස්තු විෂය |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |
| 05 | | | | | |

## පැවරුම

මහනුවර යුගයෙන් පසු බිහි වූ ගත් කතුවරුන් පස්දෙනකු තෝරාගෙන ඔවුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ නම් කරන්න.